# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 970 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 09/06/2024<br>පැය 1740 |

# මාධ්‍ය නිවේදනය

**කාන්තාවන් යොදවා අන්තර්ජාලය හරහා ලිංගික ක්‍රියාකාරකම් සිදු කිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - ළමා හා කාන්තා අපයෝජන, නිවාරණ හා විමර්ශන කාර්යංශය.**

කාන්තාවන් අයුතු ලෙස සිර කර තබා ගනිමින් අන්තර්ජාලය හරහා ලිංගික ක්‍රියාකාරකම්වල යොදවන බවට 2024.06.07 වන දින පොලිස්පති මහජන සහන මැදිරිය වෙත කරන ලද පැමිණිල්ලක් මත ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යංශය මඟින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

ඒ අනුව 2024.06.07 වන දින රාත්‍රී කාලයේ නුගේගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර විද්‍යුත් කෘත්‍රිම ලිංගික උපකරණ, විවිධ විලාසිතා සහිත කාන්තා ඇඳුම්, අසභ්‍ය දර්ශන වීඩියෝ ගත කිරීමට යොදා ගන්නා උපකරණ, ජංගම දුරකථන, ක්‍රෙඩිට් කාඩ්පත්, දේශීය හා විදේශීය මුදල් ඇතුළු දේපල සමඟ සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් හා සැකකාරිය අවුරුදු 28 ක් වන පාගොඩ, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් විසින් මිරිහාන පොලිස් වසමේ ඉහත ලිපිනයේ පොල් තෙල් බෙදා හරින ව්‍යාපාරයක් පවත්වා ගෙන යන බව වෙබ් අඩවියක ෆේස්බුක් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යමින් එම ගිණුම මඟින් හා අනෙකුත් සමාජ මාධ්‍ය උපයෝගී කර ගනිමින් අදාල ආයතනයේ සේවය කිරීම සඳහා සේවිකාවන් බඳවා ගන්නා බවට ප්‍රචාරය කර ඇත.

ඒ අනුව රැකියා අපේක්ෂාවෙන් පැමිණෙන කාන්තාවන් ඉහත ස්ථානයේ බලහත්කාරයෙන් රඳවා ගනිමින් ඔවුන් අන්තර්ජාලය මඟින් සිදු කරන ලිංගික ක්‍රියාවන් සඳහා පොළඹවා ගැනීම සිදු කර ඇත. එහිදී එම සේවිකාවන්ට විවිධ ලාබාල වයස් නිරූපණය වන පරිදි ඇඳුම් ආයිත්තම් වලින් හැඩ ගන්වා විවිධ ස්වයං වින්දන උපකරණ හා විවිධ කෘත්‍රිම ලිංගික උපකරණ යොදා ගනිමින් ලිංගික හැසිරීම් සිදු කරවා අසභ්‍ය ඡායාරූප හා වීඩියෝ දර්ශන ලබාගෙන අන්තර්ජාලය වෙත මුදා හරිමින් ප්‍රසිද්ධ කර හා

සජීවී ලෙස එම අසභ්‍ය වීඩියෝ දර්ශන සේවාලාභීන් වෙත නැරඹීමට සලස්වා සැකකරු හා සැකකාරිය විසින් මුදල් ඉපයීම සිදු කර ඇත.

මෙම ක්‍රියාව සැකකරුවන් විසින් දැනට වසර එකහමාරක පමණ කාලයක සිට සිදුකර ඇති අතර, ලිංගික සේවය සපයනු ලබන සේවිකාවන්ට විවිධ පැකේජ හඳුන්වා දෙමින් කාලසීමාව අනුව ඔවුන් වෙත මුදල් ගෙවීම් සිදු කර ඇත. එසේම සේවිකාවන්ගේ තොරතුරු ඇතුලත් පෝරම ලබාගෙන බැඳුම්කරයකට අත්සන් කර ඇති අතර ඇතැම් අවස්ථාවන් වලදී ලිංගික සේවය සපයන කාන්තාවන්ට මත්ද්‍රව්‍ය භාවිතා කිරීමටද ලබාදී ඇත. තවද එම ස්ථානයේ කාන්තාවන් විසින් සිදු කරන ලිංගික ක්‍රියාකාරකම් පිළිබඳ දර්ශන අත්අඩංගුවට ගත් සැකකාරියගේ බාල වයස්කාර දැරියටද නැරඹීමට සලස්වා ඇති බවට විමර්ශනවල දී අනාවරණය වී ඇත.

ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**